රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 337

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1986 ජුලි මස 28 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## ඇටෝර්නි ජනරාල් ගේ උපදෙස් හෝ අදහස්.

"ඇටෝර්නි ජනරාල්ගේ උපදෙස් හෝ අදහස්" යන ශීර්ෂයෙන් යුත්, ආයතන සංග්‍රහයේ XXXIII වන පරිච්ඡේදයේ 1 වැනි ඡේදයට, විශේෂයෙන්ම 1:1 උප ඡේදයට ඔබගේ අවධානය යොමු කිරීම අවශ්‍ය වී ඇත. පහසුව සඳහා මෙම උප ඡේදය මෙහි උපුටා දක්වමි.

"When the advice or opinion of the Attorney-General is sought, the point on which such advice or opinion is sought should be stated precisely. He should be furnished with a full and complete statement of the facts of the case together with references to the relevant pages of any office file that is forwarded.

If he has been consulted before on the same question reference should be quoted to any previous opinions given by him."

02. ඇටෝර්නි ජනරාල් අමතා ලිපි යවන බොහෝ අවස්ථාවලදී මෙම ඡේදයේ අදාළ වන සියලුම විධිවිධාන වලට අනුකූලව කටයුතු කිරීමට නිසි සැළකිල්ලක් යොමුකර නැති බැව් පෙනී ගොස් තිබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ කරුණු නිරාකරණය කරගැනීම සඳහා තමාගෙන් උපදෙස් අපේක්ෂා කරන අය සමග ලිපි ගනුදෙනු හුවමාරු කරගැනීමට ඇටෝර්නි ජනරාල් වරයාටත් ඔහුගේ නිලධාරීන්ටත් සිදුවී ඇත. මෙම ඡේදයේ විධිවිධාන නිසි ආකාරයට පිළිපැද තිබුණේ නම්, එවැනි ලියුම් ගනුදෙනු අවශ්‍ය නොවනු ඇත.

03. ඇටෝර්නි ජනරාල්ගේ උපදෙස් ලබාගන්නා විට, ආයතන සංග්‍රහයේ XXXIII වන පරිච්ඡේදයේ 1 වැනි ඡේදය සුපරීක්ෂාකාරීව කියවා බලා, එහි සඳහන් විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම නිලධාරීන්ගේ අවධානය යොමු කරනු මැනවි. එසේ කිරීම ඉක්මනින් උපදෙස් ලබාගැනීමටත්, නොපමාව නඩු ගැටළු නිරාකරණය කරගැනීමටත්, උපදෙස් ලබාගැනීම අපේක්ෂා කරන්නාගේම ප්‍රයෝජනය සඳහා වන බව අවධාරණයෙන්ම දැක්විය යුතුය.

Siriwardhana
ඩී. බී. අයි. පී. එස්. සිරිවර්ධන
ලේකම්
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

එන්/-